# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1999/48 - 2016 දෙසැම්බර් මස 30 වැනි සිකුරාදා - 2016.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනත

1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 5 වන වගන්තිය සමග කියවිය යුතු 61 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ගයන්ත කරුණාතිලක,
පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 15 වැනිදා,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග 2017 අංක 1 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා (සිනමා ශාලා ප්‍රක්ෂේපණ පිරිවිතර) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2017 ජනවාරි මස 01 දින සිට බලාත්මක විය යුතුය.

2. ශ්‍රී ලංකාවෙහි ක්‍රියාත්මක සියලුම සිනමා ශාලා සඳහා බලපවතින අංකිත තාක්ෂණ ප්‍රක්ෂේපණ පිරිවිතර ලෙස (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව විසින් තත් කාර්යය සඳහා නිකුත් කරනු ලබන කොන්දේසි සහ නියමයන් ට යටත් ව තිරස් සහ සිරස් පික්සල් වැඩි කළ අගය 2048×1080 (පික්සල් 2,211,840) හෙවත් 2K හෙවත් 2.2 මෙගාපික්සල් යන අවම අගය ලෙස ක්‍රියාත්මක විය යුතුය.

3. (1) දැනට ක්‍රියාත්මක සිනමා ශාලාවක හෝ අලුතින් ඉදිකරන ලද සිනමා ශාලාවක ප්‍රක්ෂේපණ ක්‍රමවේදය අංකිත තාක්ෂණයට පරිවර්තනය හෝ ස්ථාපනය කිරීමේ දී උක්ත නියෝග 2 හි දක්වා ඇති අවම පිරිවිතර යොදා ගත යුතු අතර එකී ක්‍රමවේදය පිළිබඳ සංස්ථාව වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. සංස්ථාව මගින් අදාළ පරිවර්තනයට හෝ ස්ථාපනයට අදාළ කොන්දේසි සහ නියමයන් පමුණුවනු ඇති අතර එකී පරිවර්තනය හෝ ස්ථාපනය අවසන් වූ පසු එම සිනමා ශාලාව සඳහා සංස්ථා සභාපතිවරයා විසින් නියම සහ කොන්දේසි වලට යටත්ව සහ මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ගාස්තු මත වසරකට වරක් අලුත් කළ යුතු වන සේ අංකිත තාක්ෂණ චිත්‍රපට ප්‍රදර්ශන බලපත්‍රයක් නිකුත් කරනු ඇත.


1A - G 24798 — 10 (2016/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) සංස්ථාවේ ලිඛිත අනුමැතිය ලද මේ වන විට අංකිත තාක්ෂණයට ප්‍රක්ෂේපණ ක්‍රමවේදය පරිවර්තනය කරන ලද සියලුම සිනමා ශාලා සංස්ථා සභාපතිවරයා වෙතින් නියම සහ කොන්දේසි වලට යටත්ව සහ මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ගාස්තු මත වසරකට වරක් අලුත් කළ යුතු වන සේ අංකිත තාක්ෂණ චිත්‍රපට ප්‍රදර්ශන බලපත්‍රයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

(3) යම් සිනමා ශාලාවක් තවදුරටත් ප්‍රක්ෂේපණ ක්‍රමවේදය ලෙස මිලිමීටර 35 පටලපට තාක්ෂණය භාවිතා කිරීමට කටයුතු කරන්නේ නම් ඒ පිළිබඳ ලිඛිතව සංස්ථා සභාපතිවරයා වෙත දැනුම් දිය යුතුය. එවැනි සිනමා ශාලා සඳහා සංස්ථා සභාපතිවරයා විසින් නියම සහ කොන්දේසි වලට යටත්ව සහ මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ගාස්තු මත වසරකට වරක් අලුත් කළ යුතු වන සේ මිලිමීටර 35 පටලපට තාක්ෂණ චිත්‍රපට ප්‍රදර්ශන බලපත්‍රයක් නිකුත් කරනු ඇත.

(4) ඉහත (1), (2) සහ (3) වන ඡේදවල දක්වා ඇති සිනමා ශාලා මින් මතු චිත්‍රපට ප්‍රදර්ශනයේ දී ඉහත සඳහන් අනුමත ප්‍රක්ෂේපණ පිරිවිතර වලින් බැහැරව මුදල් අය කර සිදු කරන මහජන ප්‍රදර්ශන නොකළ යුතුය. කෙසේ වෙතත් චිත්‍රපට උළෙලක දී හෝ ආධාර හෝ උපහාර දර්ශනයක දී හෝ විශේෂ අවස්ථානුගත කරුණු වලදී සංස්ථා සභාපතිවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය මත ඉහත සඳහන් පිරිවිතර වලින් පරිබාහිර තාක්ෂණ ක්‍රමවේදයක් මගින් චිත්‍රපට ප්‍රදර්ශනය කළ හැකිය.

4. මෙම නියෝග යටතේ බලපත්‍රයක් ලබාගත් යම් සිනමා ශාලාවක් අදාල බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇත්තාවූ පැවතිය යුතු අවම තාක්ෂණික ප්‍රමිති, සනීපාරක්ෂක පහසුකම් සහ නැරඹීමේ පහසුකම් සම්බන්ධයෙන් ද සභාපතිවරයා විසින් පනවනු ලබන්නාවූ නියම සහ කොන්දේසි වලට අනුකූලව ද ක්‍රියා කළ යුතුය.

5. (අ) බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් සිනමා ශාලාවක් සම්බන්ධයෙන් ද, එම සිනමා ශාලාවෙහි, ඉහත 3 (4) සහ 4 වන නියෝග යටතේ සභාපතිවරයා විසින් පනවනු ලබන නියම සහ කොන්දේසි අදාළ බලපත්‍රලාභියා විසින් පැහැරහැර හෝ කඩකර ඇත්නම්:

(ආ) සභාපතිවරයා විසින් බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම හෝ දඩ මුදල් පැනවීම යන ඕනෑම නියමයක් කරනු ලැබිය හැකිය.

6. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියෝගවල-

"පික්සල්" යන්නෙන් ඉංග්‍රීසි pixel යන පදය අදහස් වේ.

''මෙගා පික්සල්" යන්නෙන් ඉංග්‍රීසි megapixel යන පදය අදහස් වේ.

"මිලිමීටර 35 පටලපට" යන්නෙන් ඉංග්‍රීසි 35 millimeter celluloid යන පද අදහස් වේ.

"සිනමා ශාලා" යන්නෙන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සහ ක්‍රියාත්මකවීමට නියමිත සියලුම චිත්‍රපට ප්‍රදර්ශන ශාලා අදහස් වේ

''චිත්‍රපට" යන්නෙන් දේශීය හෝ විදේශීය චිත්‍රපට අදහස් වේ.

"ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව" යන්නෙන් 1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව අදහස් වේ.

## උපලේඛනය

3 (1), (2) සහ (3) නියෝගවල සඳහන් ව ඇති බලපත්‍ර ගාස්තුව ආසන 150 දක්වා වූ සිනමා ශාලා සඳහා රුපියල් පන් දහසක් (රු. 5,000/=), ආසන 350 දක්වා වූ සිනමා ශාලා සඳහා රුපියල් හත් දහස් පන්සියයක් (රු. 7,500/=) සහ ආසන 350 ට වැඩි සිනමා ශාලා සඳහා රුපියල් දස දහසක් (රු. 10,000/=) විය යුතුය.

1-444/1

---

## 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනත

1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 5 වන වගන්තිය සමග කියවිය යුතු 61 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ගයන්ත කරුණාතිලක,
පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 15 වැනිදා,
කොළඹ දී ය.

**නියෝග**

1 මේ නියෝග 2017 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා (විවිධ ගාස්තු) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2017 මාර්තු මස 01 දින සිට බලාත්මක විය යුතුය.

2 (1) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සිනමා ශාලාවක් 2016 අංක 1 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා (සිනමා ශාලා ප්‍රක්ෂේපණ පිරිවිතර) නියෝග ප්‍රකාර අනුමත අංකිත තාක්ෂණ ප්‍රක්ෂේපණ ක්‍රමවේදයට පරිවර්තනය කළ පසු (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ අනුමැතිය මත ප්‍රවේශ පත්‍රයක් සඳහා වූ ඇතුල්වීමේ ගාස්තුවට සහ විනෝද බද්දට අමතරව සෑම සිනමා ශාලාවක් විසින් ම (මෙහි මින් මතු "වැඩිවීම" යනුවෙන් සඳහන් කරනු ලබන) අය කළ ගාස්තුව,

(1.1) දේශීය හෝ විදේශීය චිත්‍රපටයක් සඳහා ප්‍රවේශ පත්‍රයේ වටිනාකමින් සියයට හතක් (7%) අය කළ යුතුය.

(අ) එකී සියයට හතක (7%) මුදලින් රුපියල් තුනක් (රු. 3/=) දේශීය චිත්‍රපටයක් නම් එහි නිෂ්පාදක ට හෝ විදේශීය චිත්‍රපටයක් නම් රුපියල් එකයි සත පනහ (රු. 1.50/=) බැගින් 1986 අංක 3 දරන සිනමා ශිල්පීන් සහ තාක්ෂණ ශිල්පීන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරයට හා 1993 දෙසැම්බර් 27 වන දින අංක 799/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් පිහිටුවා ඇති ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලට ද

(ආ) අංකිත තාක්ෂණික දෛනික ප්‍රවේශ පත්‍ර වාර්තාවට රුපියල් දෙකක් (රු. 2/=) ද

(ඇ) ඉහත ගෙවීම් අඩු කළ පසු ඉතිරි වන මුදලින් සියයට අනූවක් (90%) සිනමා ශාලා ප්‍රක්ෂේපණ ක්‍රමවේදය 2016 අංක 1 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා (සිනමා ශාලා ප්‍රක්ෂේපණ පිළිවිතර) නියෝග හි සඳහන් පරිදි පරිවර්තන කළ සිනමා ශාලාව හෝ ආයෝජක අතරේත් ඉතිරි සියයට දහය (10%) සංස්ථාවට ලැබෙන සේත් බෙදී යා යුතුය.

(1.2) දේශීය හෝ විදේශීය සම්මානනීය චිත්‍රපටයක් සඳහා ප්‍රවේශ පත්‍රයේ වටිනාකමින් සියයට හතයි දශම පහක් (7.5%) අය කළ යුතුය.

(ඈ) එකී සියයට හතයි දශම පහක (7.5%) මුදලින් දේශීය චිත්‍රපටයක් නම් එහි නිෂ්පාදක ට රුපියල් තුනයි සත පනහක් (රු. 3.50/=) ද විදේශීය චිත්‍රපටයක් නම් චිත්‍රපටය බෙදාහරින බලපත්‍රලාභියාට රුපියල් දෙකයි සත පනහක් (රු. 2.50/=) ද

(ඉ) දේශීය චිත්‍රපටයක් නම් එය මුදාහරින සිනමා ශාලාවට රුපියල් දෙකක් ද (රු. 2/=)

(ඊ) විදේශීය චිත්‍රපටයක් නම් එය මුදාහරින සිනමා ශාලාවට රුපියල් එකයි සත පනහක් ද (රු. 1.50/=)

(උ) අංකිත තාක්ෂණික දෛනික ප්‍රවේශ පත්‍ර වාර්තාවට රුපියල් දෙකක් ද (රු. 2/=)

(ඌ) ඉහත ගෙවීම් අඩු කළ පසු ඉතිරි වන මුදලින් සියයට අනූවක් (90%) සිනමා ශාලා ප්‍රක්ෂේපණ ක්‍රමවේදය 2016 අංක 1 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා (සිනමා ශාලා ප්‍රක්ෂේපණ පිළිවිතර) නියෝග හි සඳහන් පරිදි පරිවර්තන කළ සිනමා ශාලාව හෝ ආයෝජක අතරේත් ඉතිරි සියයට දහය (10%) සංස්ථාවට ලැබෙන සේත් බෙදී යා යුතුය.

3 චිත්‍රපටියක ප්‍රවේශපත්‍ර විකිණීමෙන් ලැබෙන මුදලින් වැඩිවීම සහ විනෝද බද්ද අඩුකිරීමෙන් පසු ඉතිරිවන මුදල "චිත්‍රපට කුලිය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

4 චිත්‍රපටයක ආරම්භක ප්‍රදර්ශන වටය තුළ දී සහ පළමු වන ප්‍රදර්ශන වටය තුළ දී ලැබෙන සම්පූර්ණ චිත්‍රපට කුලිය-

(එ) දේශීය චිත්‍රපටයක් සම්බන්ධයෙන් වන විට පහත දැක්වෙන ආකාරයට බෙදාහැරිය යුතුය.-

| | | |
|---|---|---|
| (i) | නිෂ්පාදකවරයා | 45% |
| (ii) | සිනමා ශාලාව | 45% |
| (iii) | බලපත්‍රලාභී බෙදාහරින්නා | 10% |

(ඒ) විදේශීය චිත්‍රපටයක් සම්බන්ධයෙන් වන විට පහත දැක්වෙන ආකාරයට බෙදාහැරිය යුතුය.-

| | | |
|---|---|---|
| (i) | ආනයනකරු | 40% |
| (ii) | සිනමා ශාලාව | 50% |
| (iii) | බලපත්‍රලාභී බෙදාහරින්නා | 10% |

5 චිත්‍රපටයක් ආරම්භක ප්‍රදර්ශන වටය තුළ දී සහ පළමු වන ප්‍රදර්ශන වටය තුළ දී හැර සිනමා ශාලාවක ප්‍රදර්ශනය කිරීමෙන් ලැබෙන සම්පූර්ණ චිත්‍රපට කුලිය-

(එ) දේශීය චිත්‍රපටයක් සම්බන්ධයෙන් වන විට පහත දැක්වෙන ආකාරයට බෙදාහැරිය යුතුය.-

| | |
|---|---|
| (i) නිෂ්පාදකවරයා | 30% |
| (ii) සිනමා ශාලාව | 60% |
| (iii) බලපත්‍රලාභී බෙදාහරින්නා | 10% |

(ඔ) විදේශීය චිත්‍රපටයක් සම්බන්ධයෙන් වන විට පහත දැක්වෙන ආකාරයට බෙදාහැරිය යුතුය.-

| | |
|---|---|
| (i) ආනයනකරු | 30% |
| (ii) සිනමා ශාලාව | 60% |
| (iii) බලපත්‍රලාභී බෙදාහරින්නා | 10% |

6 මේ නියෝග යටතේ සංස්ථාවට අයවිය යුතු යම් මුදලක් එසේ ප්‍රේෂණය කිරීම පැහැර හරින සෑම සිනමා ශාලාවක් විසින් ම සිනමා ශාලාවෙන් අයවිය යුතු මාසික ශේෂ මුදල පදනම් කොටගෙන ගණන් බලනු ලබන එම පැහැර හැරීමේ මුදල මත, මාසයකට සියයට එකක (1 %) අනුප්‍රමාණයක වූ මුදලක් පොලිය වශයෙන් සංස්ථාවට ගෙවනු ලැබිය යුතුය.

7 චිත්‍රපට උළෙලක දී හෝ ආධාර දර්ශනයක දී හෝ සංස්ථා සභාපතිවරයාගේ ලිඛිත අවසරය සහිත චිත්‍රපටයක් සම්බන්ධයෙන් හැර, කිසිම සිනමා ශාලාවක් විසින් මෙම නියෝග වල සඳහන් වැඩිවීම, විනෝද බද්ද සහ චිත්‍රපට කුලිය යන මුදල්වල එකතුවට වැඩි වූ යම් ගාස්තුවක් යම් චිත්‍රපටයක් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් අයකරනු නොලැබිය යුතුය.

8 ඉහත 2 (අ), (ආ), (ඇ), (ඉ), (ඊ) සහ (උ) යන නියෝග වල දැක්වෙන අය කිරීම් අගය ඒ ඒ සිනමා ශාලා මෙම නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ කළ දින සිට වසර දෙකක (2) ක කාලයක් සඳහා වෙනස් නොවිය යුතුය. මූලික වසර දෙකක (2) කාලය ඉක්මගිය පසු සංස්ථා සභාපතිවරයා විසින් නිකුත් කරන චක්‍රලේඛ මගින් නිශ්චිත කාලසීමාවක් සඳහා එකී අගයන් වෙන් වෙන්ව ප්‍රතිශතාත්මක ලෙස ඉහළ දැමිය හැකිය.

9 මෙම නියෝග බලපැවැත්වෙන ඕනෑම සිනමා ශාලාවක් ඉහත නියෝග යටතේ සභාපතිවරයා විසින් පනවනු ලබන නියම සහ කොන්දේසි පැහැරහැර හෝ කඩකර ඇත්නම්:

(ආ) සභාපතිවරයා විසින් බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම හෝ දඩ මුදල් පැනවීම යන ඕනෑම නියමයක් කරනු ලැබිය හැකිය.

10 1993 දෙසැම්බර් මස 27 වන දින අංක 799/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1993 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා (විවිධ ගාස්තු) නියෝග සහ 1996 ඔක්තෝබර් මස 24 වන දින අංක 946/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1996 අංක 1 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා (විවිධ ගාස්තු) නියෝග සහ 2007 ජුනි මස 20 වන දින අංක 1502/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2007 අංක 4 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා (විවිධ ගාස්තු) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

11 පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියෝගවල-

"අංකිත තාක්ෂණ ප්‍රක්ෂේපණ ක්‍රමවේදය " යන්නෙන් 2016 අංක 1 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා (සිනමා ශාලා ප්‍රක්ෂේපණ පිරිවිතර) නියෝග මගින් ප්‍රකාශිත නියමයන් අදහස් වේ

"අංකිත තාක්ෂණික දෛනික ප්‍රවේශ පත්‍ර වාර්තාව " යන්නේ ඉංග්‍රීසි පද electronic daily report යන්න අදහස් වේ.

"සිනමා ශාලා" යන්නෙන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සහ ක්‍රියාත්මක වීමට නියමිත සියලුම චිත්‍රපට ප්‍රදර්ශන ශාලා අදහස් වේ.

''චිත්‍රපට" යන්නෙන් දේශීය හෝ විදේශීය චිත්‍රපට අදහස් වේ.

"දේශීය හෝ විදේශීය සම්මානනීය චිත්‍රපටයක් " යන්නෙන් 2016 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා (චිත්‍රපට බෙදාහැරීමේ) නියෝගවල අර්ථ දක්වා ඇති චිත්‍රපට අදහස් වේ.

"සිනමා ශිල්පීන් සහ තාක්ෂණ ශිල්පීන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය" යන්නෙන් 1986 අංක 3 දරන පනතින් පිහිටුවා ඇති සිනමා ශිල්පීන් සහ තාක්ෂණ ශිල්පීන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය අදහස් වේ.

"ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල" යන්නෙන් 1993 දෙසැම්බර් 27 වන දින අංක 799/1 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙන්* පිහිටුවා ඇති ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල අදහස් වේ.

"ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව" යන්නෙන් 1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව අදහස් වේ.

1-444/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.